**පන්නල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 214,747,057 ක් වූ නමුත් උපලේඛන අනුව ශේෂය රු. 207,767,533 ක් වීමෙන් රු. 6,979,524 ක වෙනස්කම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 අවසන් මූල්‍ය ප්‍රකාශන මගින් මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වටිනාකම රු. 15,389,078 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | විවිධ හේතු මත නොසැසඳීම් පවතින අතර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති</u> | | | |
| (i) රීති 193 | අයවැයගත ආදායම්, වියදම් සහ තථ්‍ය ආදායම්, වියදම් අතර විචලනයන් සඳහා කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ සිට පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ii) රීති 218 | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණු අතර උපලේඛන හා ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය අතර නොසැසඳීම් තිබුණි. | රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඔප්පු සහිතව සභාව භුක්ති විඳින ඉඩම් පමණක් ඉඩම් ලේඛනයේ ඇති අතර අවසන් මූල්‍ය ප්‍රකාශනය හා නොසැසඳෙන බව සඳහන් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.89,654,732 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,142,498 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමේ 2018 ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා අවම වශයෙන් රුපියල් මිලියන 25 ක මුදල් ශේෂයක් නිෂ්කාර්යව පවත්වාගෙන ගොස් තිබූ නමුත් මෙම අතිරික්ත මුදල් ඵලදායී කටයුත්තකට ආයෝජනය කිරීම කෙරෙහි සලකා බලා නොතිබුණි. | සභාවේ මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණයෙන් පෙන්වා දුන් වරද ඉදිරියේදී නිවැරදි කරමින් සභාවට අයිති මුදල් ඵලදායී ලෙස මෙහෙයවීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 10,254 | 9,820 | 9,475 | 2,245 | 9,421 | 11,220 | 12,182 | 2,587 |
| II. | බදු කුලී | 22,546 | 22,238 | 21,911 | 2,267 | 22,310 | 21,464 | 22,238 | 4,128 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,386 | 1,378 | 1,378 | - | 1,385 | 1,384 | 1,384 | - |
| IV. | වෙනත් ආදායම් | 152,559 | 113,002 | 113,445 | - | 129,320 | 116,031 | 113,915 | 56,608 |
| | එකතුව | 186,745 | 146,438 | 146,209 | 4,512 | 162,436 | 150,099 | 149,719 | 63,323 |

**2.3.2 වරිපනම් හා බදු**

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හමන්ගල්ල උපකාර්යාලයේ වසර 03 ක කාලය ඉක්මවා තිබූ අක්කර බදු හිඟය රු.332,131 ක් වූ අතර වසර 10 ඉක්මවූ අක්කර බදු හිඟය රු.264,466 ක් විය. තවද වසර 10 ඉක්මවූ කඩ කුලී හිඟය රු.13,200 ක් විය. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අක්කර බදු ලේඛන නිවැරදි කිරීමටත් හිග අක්කර බදු අය කිරීමට හෝ කපා හැරීම් සිදු කිරීමටත් කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | මාකදුර උපකාර්යාලයේ වසර 05 ඉක්මවූ වරිපනම් බදු ශේෂය රු.97,581 ක් වූ අතර හිඟ අක්කර බදු ශේෂය රු.166,206 ක් විය. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අක්කර බදු ලේඛන නිවැරදි කිරීමටත් හිග අක්කර බදු අය කිරීමට හෝ කපා හැරීම් සිදු කිරීමටත් කටයුතු කරන බව දන්වා සිටිමි. |

**2.3.3 කුලී**

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු කුලී හිඟය රු. 2,267,000 ක් විය. | හිඟ කුලී මුදල් අය කර ගත යුතු වේ. | කඩ කුලී හිග අය කර ගැනීම සඳහා නිවේදන ලිපි යවා ඇති අතර නඩු පැවරීම් 02 ක් සිදු කර ඇත. |

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.10,012,768 ක් හා මුද්දර ගාස්තු රු.97,265,336 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලදී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් 2018 දෙසැම්බර් 31 වන විට අනු කරුණු ඇතුළත් කාරණා 51 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අවශ්‍යතාවය අනුව අතුරු ව්‍යවස්ථා පැනවීමටත් පැනවූ අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරීමත් සිදුකළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා 51 ක් වැළඳගෙන ඇති අතර ඉන් 42 ක් සම්මත අතුරු ව්‍යවස්ථා වන අතර සභාවේ අවශ්‍යතාවය මත අනෙකුත් අතුරු ව්‍යවස්ථා 09 ක් වැළඳ ගැනීමට කටයුතු කර ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයකට වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂය රු.99,637,503 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ග ගන්නා බව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානට වර්ෂයක කාලය ඉක්මවා තිබූ රු. 48,419,187 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ගෙවා අවසන් කිරීමට හෝ සභා තීරණයක් මගින් ආදායමට ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**3.3.1 සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 39 ක් වූ අතර සංවර්ධන නිලධාරී තනතුරු 19 ක හා කාර්යාල කම්කරුවකුගේ සේවක අතිරික්තයක් පැවතුණි. | නියමිත පුරප්පාඩු පිරවීම හා අතිරික්තයන් අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විධිමත් පරිදි අනුමැතිය ලබාගෙන බඳවාගැනීමේ ක්‍රියාවලිය සඳහා යොමුකොට ඇති අතර පළාත් පාලන දෙපාර්තමේන්තුවට අනුයුක්ත සංවර්ධන නිලධාරින් 19 දෙනෙකු අප කාර්ය මණ්ඩල වාර්තාවේ අතිරික්ත ලෙස දක්වා ඇත. කාර්යාල කම්කරු පත්වීම අනුමත කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**3.3.2 සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට රු.205,394 ක සේවක ණය මුදලක් දීර්ඝ කාලයක සිට අය නොවී පැවතුණි. | අය නොවී පවතින සේවක ණය මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දීර්ඝ කාලයක සිට අය නොවී පැවති සේවක ණය ශේෂ ඇපකරුවන්ගෙන්, විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ අයකර ගැනීමටත්, අයකළ නොහැකි ශේෂ සහා තීරණයක් ගෙන කපා හැරීමට කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ සමීක්ෂණයට ඉදිරිපත් නොවූ රු.63,217 ක් වටිනා පොත් 521 ක සහ මාකඳුර පුස්තකාලයේ පාඨකයින් බැහැරට ගෙන ගොස් නැවත භාර නොදුන් රු.83,589 ක් වටිනා පොත් 336 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කටයුතු කළ යුතු වේ. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරිමේදී පසුව හමු වූ පොත් සමීක්ෂණ ලේඛන වල සටහන් කර සමීක්ෂණ වාර්තාවෙන් කපා ඉවත් කිරීමට කටයුතු කර ඇත. |

**3.5** **මතභේදයට තුඩුදෙන කරුණු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 අගෝස්තු 01 දිනැති අංක 1882/22 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නිවාස දේපල සංවර්ධනය කර අලෙවි කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල වන පරිදි සභාව විසින් ලබා දී ඇති කොන්දේසි අනුව සංවර්ධනය නොකිරීම, පොදු පහසුකම් සඳහා හිමිකම් ඔප්පුව ලියාපදිංචි කර නොදීම, 1% බදු මුදලට අදාල වන රු.578,545 ක ඇස්තමේන්තුගත වටිනාකම නොගෙවීම,තේ, පොල් , රබර් කැබලි කිරීම් මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන සහ සභාව මගින් ඉඩම් කට්ටි සැලැස්ම අනුමත කර නොගෙන අක්කර 16, රූඩ් 01, පර්චස් 27.4 ක් වූ ඇළබඩගම පල්ලියවත්තේ ඉඩම සංවර්ධනය කර විකිණීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල වන පරිදි කටයුතු සිදු කළ යුතු වේ. | 2019.12.31 දිනට පෙර සභාව ලබා දී ඇති සියලු සංවර්ධන කොන්දේසි නිමකර ඉඩම් කට්ටි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බවට අදාල ආයතනය 2019.03.27 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට පොරොන්දු වී ඇත. |

**3.6** **වත්කම් කළමනාකරණය**

**3.6.1** **වත්කම් ලේඛනගත නොකිරීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි ක්‍රමානුකූලව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මත පදනම්ව වත්කම් ගිණුම්වල දක්වා තිබුණි. | වත්කම් ලේඛන නිසි පරිදි පවත්වාගෙන යා යුතු වේ. | ප්‍රධාන කාර්යාලයේ ලේඛණගත කර ඇත්තේ ඔප්පු මගින් අයිතිය පවත්නා ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පමණි. නමුත් සංවර්ධන සහා පැවති කාලයේ සිට භාවිත කර ප්‍රාදේශීය සභාව භුක්ති විඳින, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සතු හා වෙනත් ඉඩම් රාශියක් ප්‍රදේශීය සභාව සතු වේ. |

### 3.6.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 වර්ෂයේ දැයට කිරුල සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකර තිබූ නව බස් නැවතුම්පොල කඩ කාමර සහ යක්විල සතිපොල සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වත්කම් පවරා දීමට කටයුතු කර නොමැත. |

### 3.6.3 නිශ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වතුර මෝටර් 02 ක් සහ වෝටර් ඩිස්පෙන්සර් එකක් නිෂ්කාර්යව ගබඩාව තුල පැවති අතර එම භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කළ යුතු වේ. | වතුර මෝටර් දෙකෙහි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර බලා එහි වටිනාකම තක්සේරු කර ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කර විගණන කටයුතු සිදු කළ යුතු අතර අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කිරීමට කටයුතු කරමි. |